# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## දෙවන වාර වැඩ පැවරුම අංක 05 -2020
## බුද්ධ ධර්මය

Name / Index No :......................................................... **Grade 3**

**2020.05.30 සිට 2020.06.05 සතිය දක්වා කරවන්න.**

❖ දෙමාපියන් සඳහා උපදෙස්,

- **හැකි අය මෙම අභ්‍යාස තනි පැත්තට මුද්‍රණය කර ගැළපෙන ලෙස කොටස් කපා බුද්ධ ධර්මය පොතේ අලවන්න.**
- හැකි ලෙස දරුවාට පාඩමේ කොටස් පැහැදිළි කර දෙන්න.
- පිළිතුරු පමණක් දරුවාට ලියන්න දෙන්න.
- පාඩමට අදාළ Whatsapp මගින් Video Clips, Audio Clips එවා ඇත්නම් පෙන්වා දී පැහැදිලි කර දෙන්න

# 11 තිත්තිර ජාතකය





❖ පහත වාක්‍ය උපයෝගී කරගෙන තිත්තිර ජාතක කථාව චිත්‍ර අඳිමින් කතාව ගොඩ නගන්න.

01. හිමාලය වනයේ මැද මහා නුග ගසක් තිබුණා.

02. මේ නුග ගස යට හමුවන ඇතෙකු වඳුරෙකු හා වටු කුරුල්ලකු මිතුරු ව විසූහ. දිනපතා හමුවන ඔවුහු වැඩිහිටියන්ට ගරු කළ යුතු බව සිතා, දිනක් අප අතරින් වැඩිහිටියා කවරෙක් දැයි සෙවීමට ඔවුහු යෝජනා කළහ. මහා නුග ගස පළමුව දුටු කෙනා වැඩිහිටියා බවට යෝජනා කර ගත්හ.

03. කැලේ ඇවිදින විට නුග ගස බඩේ ගැවුණු බව ඇතා පැවසුවේ ය.

04. තමන් බිම හිටගෙන නුග ගසේ දළු කෑ බව වඳුරා පැවසුවේ ය.

Richmond College - Grade 3 – 2020

05. වෙන නුග ගසකින් ඇටයක් කා මලපහ කළාට පසු මේ නුග ගස පැළ වූ බව වටු කුරුල්ලා පැවසුවේ ය.

06. ඒ අනුව වැඩිහිටියා තෝරා. වැඩිහිටි වටුකුරුල්ලාට එදා සිට අනිත් සත්තු දෙදෙනා ගරු බුහුමන් දැක්වූ හ.

**වැඩිහිටියන් යනු තමාට වඩා වයසින් වැඩි අයටයි. බාහිර ස්වරූපයෙන් කුඩා වූවත් වැඩිහිටියන් හඳුනාගෙන ඔවුන්ට ගරු බුහුමන් දැක්වීම උතුම් ගුණ ධර්මයකි.**

02. වැඩිහිටියන් කවුරුන් ද යන්න ඔබ තෝරා පහත වචන රවුම් කරන්න.

1. සීයා
4. ගුරුතුමිය
7. නංගී
9. අම්මා
12 අක්කා
2. ආච්චි
5. මාමා
8. අයියා
10. තාත්තා
13. මල්ලී
3. නැන්දා
4. පුංචි අම්මා
11. පොඩි හාමුදුරුවෝ

Richmond College – Grade 3 – 2020

03. යා කරන්න.

| | | |
|---|---|---|
| 1. | බුදුරජානන් වහන්සේ මහා කරුණා ගුණයෙන් පිහිට වූවා. | විශාඛා සිටු දේවිය |
| 2. | බුදු සසුනේ අග්‍ර දායිකා තනතුර | වටුවා, ඇතා වඳුරා |
| 3. | තිත්තිර ජාතක කතාවේ එන සතුන් තිදෙනා | සෝපාක,ට්ටකුණ්ඩලී, රජ්ජුමාලා |
| 4. | සුද්ධෝදන රජතුමා | භද්දියනුවර සිටුවරයෙකි |
| 5. | ධනංජය සිටුතුමා | සංඝමිත්තා තෙරණින් වහන්සේ |
| 6. | ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩම කිරීම. | කිඹුල්වත් පුර අග රජ |

04. ක්‍රියාකාරකම්.

01. **"වැඩිහිටියන්ට ගරු කරමු"** යන මාතෘකාව යටතේ වැකි 2 ක් ලියන්න.

- ...................................................................................................................

...................................................................................................................

...................................................................................................................

- ...................................................................................................................

...................................................................................................................

...................................................................................................................

Richmond College - Grade 3 - 2020

02. වැඩිහිටයන්ට ගරු කරන අවස්ථාවක් චිත්‍රයට නගන්න.

03. තිත්තිර ජාතක කථාව මතකයෙන් ඔබේ අම්මාට තාත්තාට කියන්න.

04. ඔබ වැඩිහිටියන්ට ගරු කරන්න පුරුදු වෙන්න.

05. ඔබ, වැඩිහිටියන්ට ගරු බුහුමන් දැක්වෙන කවි පංති වෙනත් පොත්වලින් ගෙන පාඩම් කර ගන්න.

Richmond College - Grade 3 – 2020